# ස්වයං රැකියාව හඳුනා ගනිමු

**ජීවත්වීම සඳහා කුමණ හෝ කාර්යයක යෙදීම ස්වයං රැකියාවක් කිරීමක් ලෙසින් හැඳින්වීම යුක්තිසහගත නොවේ. එනිසා ස්වයං රැකියාවක් යනු තමන්ගේම ස්ථිර ආදායම් මාර්ගයක් සකසා ගැනීමක් ලෙස හැඳින්විය හැකිය. එමගින් තම අපේක්ෂාවන් ඉටු කර ගතහැකි වන අතර අනුනට බරක් නොවී ජීවත්වීමේ හැකියාවද ඇතිවේ.**

වර්තමානයේ ශ්‍රී ලංකාවේ අස්සක් මුල්ලක් නැර ලොකු පොඩි කාගෙත් මුවග රැව්දෙන ප්‍රධාන මාතෘකාවක් ලෙස ස්වයං රැකියාව හැඳින්විය හැකිය. දුප්පත්කම නැති කිරීමට හා රැකීරක්ෂා ප්‍රශ්ණයට විකල්ප විසඳුමක් ලෙස ස්වයං රැකියාව සැලකේ. මෑතකදී ලංකාවේ ආරම්භ කර ඇති දුප්පත්කම නැති කිරීමේ, නැති බැරි අය ඇති හැකි අය කිරීමේ ව්‍යාපාරය වන 'ජනසවිය' ක්‍රියාකාරී වැඩ සටහන යටතේද ස්වයං රැකියාවට ලබා දී ඇත්තේ ප්‍රමුඛස්ථාන යකි. ජනසවිලාභියා සහ ස්වයං රැකියාව ඉතාමත් සමීප වචන දෙකකි. මෙම ව්‍යාපාරය යටතේද මේ වන විට ස්වයං රැකියා විශාල සංඛ්‍යාවක් ආරම්භ කර ඇති අතර, ඉදිරියටද විශාල ප්‍රමාණයක් ආරම්භ කිරීමට අපේක්ෂාවෙන් සිටී. ලංකාවේ ප්‍රධාන මූල්‍ය ආයතන වන ලංකා බැංකුව,මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වැනි ආයතන වලද ස්වයං රැකියාව ප්‍රධාන විෂයයක් බවට පත්ව ඇති අතර ඒ සඳහා විශේෂ අඩු පොලී සහිත ලිහිල් ණය ක්‍රම පවා හඳුන්වා දී තිබේ. ස්වයං රැකියා සඳහා ණය ලබා ගන්නා පිරිසද, සීග්‍රයෙන් ඉහළ ගොස් ඇත. එමෙන්ම රාජ්‍ය අංශයේ සංස්ථා, දෙපාර්තමේන්තු, මෙන්ම විධායක බලතල හිමි පිරිස්ද මෑතක සිට ස්වයං රැකියා කෙරෙහි විශේෂ අවධානයක් යොමුකර ඇති බව පෙනේ. මෑතකාලීන ආර්ථික ප්‍රතිපත්ති සැකසීමේදී ස්වයං රැකියා විෂයට වැඩි නැඹුරුවක් දක්වා ඇති අතර සියළුම රාජ්‍ය සහායක සේවාවන් උපරිම මට්ටමකින් ස්වයං රැකියා ව්‍යාප්ත කිරීම සඳහා යොමු කොට තිබේ. මේ තුලින් විරැකියාව හා දුප්පත්කම නැති කිරීමට අපේක්ෂා කරන අතරම ග්‍රාමීය අංශය සංවර්ධනය කිරීමටද අපේක්ෂා කරනු ලැබේ. මේ අනුව ස්වයං රැකියාව පිළිබඳ අවධානය යොමු කිරීමේ ඇති වැදගත්කම මනාව පැහැදිලි වෙයි. එහෙත් නිශ්චිත වශයෙන්ම ස්වයං රැකියාව යනු කුමක්දැයි නිසි අවබෝධ යෙන් යුක්තව, ස්වයං රැකියා ආරම්භ කර ඇති පිරිස, කොතෙක්ද යන්න අවිනිශ්චිතය.

---

පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරි

**එම්. එස්. සේනානායක විසිනි.**

---

ශ්‍රී ලංකාවේ දිගින් දිගටම පැවත එන ආර්ථික ප්‍රශ්ණ අතර රැකී රක්ෂා හිඟය ප්‍රධාන තැනක් ගනී. එනිසා දේශපාලන, ආර්ථික හා සාමාජීය වශයෙන් ගැටළු රැසක්ම මතුවී ඇත. එහෙයින් කඩිනමින් විසඳිය යුතු ප්‍රශ්ණයක් ලෙස රැකීරක්ෂා ප්‍රශ්ණය මුල්තැනක් ගන්නා අතර ඒ සඳහා ගතහැකි විකල්ප විසඳුමක් ලෙස ''ස්වයං රැකියා'' බිහිකිරීම හැඳින්විය හැකිය. මෙහිදී ස්වයං රැකියාවක් ආරම්භ කළ පමණින්ම එය රැකියා ප්‍රශ්ණයට විසඳුමක් නොවන අතර එම ස්වයං රැකියාව ස්ථිර ආදායම් මගකට පරිවර්තනය කළයුතු වේ. මේ සඳහා පළමුවෙන්ම ස්වයං රැකියාව යනු කුමක්ද යන්න හඳුනා ගැනීම වැදගත් වේ.

## ස්වයං රැකියාව හඳුනා ගැනීම

ස්ථිර රැකියාවක් හෝ ආදායම් මාර්ගයක් නොමැති ජනතාවකට එදිනෙද ජීවත් වීම සඳහා කුමන හෝ කාර්යයක යෙදෙන්නට සිදුවේ. ඔවුන් කුලී වැඩ කිරීම ගොවිතැන් කිරීම, එළවළු වැවීම, සතුන් ඇති කිරීම, භාණ්ඩ එකතුකර විකිණීම, මළු පැදුරු විවීම, වැනි විවිධ කාර්යයන්හි යෙදී තම ජීවනෝපාය සලසා ගනී. නමුත් මෙම සෑම කාර්යය කින්ම පාහේ සිදු වන්නේ එදිනෙද දිවිපෙවෙත රැක ගැනීම පමණි. ඔවුන් දිගු කාලයක් තිස්සේ මෙම කාර්යයන්හි නිරත වී සිටියා වුවද, ආර්ථික වශයෙන් වර්ධනය වීමක් සිදු නොවුනි. එසේ නම් **ජීවත් වීම සඳහා කුමණ හෝ කාර්යයක යෙදීම ස්වයං රැකියාවක් කිරීමක් ලෙසින් හැඳින්වීම යුක්ති සහගත නොවේ. එනිසා ස්වයං රැකියාවක් යනු තමන්ගේම ස්ථිර ආදායම් මාර්ගයක් සකසා ගැනීමක් ලෙස හැඳින්විය හැකිය. එමගින් තම අපේක්ෂාවන් ඉටුකර ගත හැකි වන අතර අනුනට බරක් නොවී ජීවත්වීමේ හැකියාව ඇති වේ.**

මෙවැනි අවස්ථා වකදී තමන් විසින් මෙතෙක් කරගන ආ ව්‍යාපාර කටයුතු දෙස විමසිල්ලෙන් බැලිය යුතුය. එම ව්‍යාපාර වලින් වැඩි ආදායමක් ලබා ගැනීමට නොහැකි වීමටත්, තමන්ගේ දක්ෂතාවයන් ගෙන් ප්‍රයෝජන නොලැබී යාමටත් හේතුවූ කරුණු මොනවාද යන්න ගැන විමසිය යුතුය. මේ සම්බන්ධව ප්‍රදේශයේ ඒ පිළිබඳව අවබෝධයක් ඇති පුද්ගලයන්ගේ අදහස් විමසීම වඩාත් සුදුසුය. එසේම ස්වයං රැකියා ආරම්භ කිරීමේදී එම ප්‍රදේශයට ගැලපෙන තමන්ගේම ප්‍රදේශයේම අවශ්‍යතාවයන්ට අනුකූල වන, ප්‍රදේශයේම සම්පත් වැඩි වශයෙන් උපයෝගිකරගත හැකි ව්‍යාපාර කෙරේ වැඩි නැඹුරුවක් දැක්විය යුතුය.

කුමන ප්‍රදේශයක වුවත් ස්වයං රැකියා ව්‍යාපාරයක් ආරම්භ කරන විට කළයුතු ව්‍යාපාරය කුමක් දැයි තීරණය කළ යුත්තේ තමා විසින්මය. ප්‍රදේශයේ ඇති සම්පත් පදනම් කරගෙන එම ව්‍යාපාරය සාර්ථක කරගත හැකිය. මෙසේ තමාට සාර්ථකව කල හැකි ව්‍යාපාරය කුමක්දැයි තමා විසින්ම හඳුනා ගෙන ආරම්භ කිරීමෙන් එය සාර්ථක වේ. මෙහිදී පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම වැදගත්ය.

1. ගමේ ජනතාවට අවශ්‍ය වන දැනට ගමේ නිෂ්පාදනය නොකරන භාණ්ඩ

2. නගරයට හෝ පිට පළාත්වලට ගොස් අලෙවි කළ හැකි , ගම තුළදී පහසුවෙන් නිෂ්පාදනය කල හැකි භාණ්ඩ

3. තමාගේ හැකියාවන් සහ ගමතුල ඇති සම්පත්

මේ සම්බන්ධව විශේෂයෙන් සොයා බලා තමා විසින් කලයුතු නිෂ්පාදනය කුමක්දැයි තීරණය කළ යුතුයි. මේ අනුව ගමක ඇරඹිය හැකි ව්‍යාපාර රාශියක් තිබිය හැකි වුවද ඒ තුලින් පහසුවෙන් කලහැකි ව්‍යාපාරය කුමක්ද යන්න හඳුනා ගත හැකිය.

**රැකියා සඳහා සංවිධානය වීම :**

ග්‍රාමීය මට්ටමෙන් සංවිධානය වීම මෙහිදී වැදගත් අංගයකි. එක සමාන ව්‍යාපාරයන්හි නිරතවන පුද්ගලයන්, එම ව්‍යාපාර වලට අවශ්‍ය වන සහායක සේවාවන් සපයන පුද්ගලයන්ද සම්බන්ධ කොට ගෙන කණ්ඩායමක් ලෙස සංවිධානය වීම ව්‍යාපාරයේ සාර්ථකත්වය ට ඉවහල් වෙයි. මෙසේ සංවිධානය වීම තුලින් ඒකාබද්ධ ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම, ආයතනික සහාය ලබා ගැනීම, හා බැංකු මූල්‍යය ආයතන වලින් මූල්‍යය පහසුකම් ලබා ගැනීම වැනි කටයුතු පහසු වෙන් කෙටි කාලයක් තුල, අඩු පිරිවැයකින් යුතුව කරගත හැකිය. සංවිධානය වීම නිසා එතෙක් එම ව්‍යාපාර වලට එරෙහිව මතුවී තිබුණ බාධාවන් බොහොමයක්ද මඟ හැරීයනු ඇත. එමෙන්ම එකමුතු වීම නිසා ඇතිවූ ශක්තිය හා ධෛර්‍යයද ඉහලය. ඒ කෙසේ වුවද, අත්තම් ක්‍රම, ශ්‍රමදාන, කයිය වැනි පැරණි සම්ප්‍රදායික ක්‍රම උපයෝගී කොට ගනිමින් තම අවශ්‍යතා වයන් සංවිධානය වීම තුලින් පහසුවෙන් ඉටුකර ගත හැකිය.

එමෙන්ම ව්‍යාපාරයේ තත්ත්වය, ප්‍රමාණය අනුව ව්‍යාපාරය ආරම්භ කරනු යේ කා සමගද යන්න තීරණය කළ යුතුය. එහිදී ව්‍යාපාරය ආරම්භ කල යුත්තේ ගෘහ මූලිකයා විසින් තනිවමද, නැත්නම් පවුලේ වෙනත් අයකු සමගද/හවුලේද, එසේත් නැත්නම් පවුලේ කීප දෙනෙකු සමඟ එක්වීම හෝ පවුලෙන් බාහිර අය සමග එක්වීද යනාදී වශයෙන් තීරණය කිරීමෙන් පසුවය. ව්‍යාපාර සඳහා අවශ්‍ය වන පුද්ගලයන් ගණන තීරණය කල පසු ව්‍යාපාරයේ ස්වභාවය පිළිබඳවද සැලකිලිමත් වීම වැදගත්ය. එනම්, එය පුද්ගලික ව්‍යාපාරයක් ද, සමූපකාර සමාගම්, හෝ ප්‍රජා ව්‍යාපෘති යටතට ගැනෙන ව්‍යාපාරයක්ද යන්න අවධාරනය කල යුතුය. මෙය ව්‍යාපාර යේ පැවැත්මට සහ දියුණුවට ඉතා වැදගත් වන අංගයකි.

ඒ ඒ අයගේ ශක්තිය, හැකියාව හා උත්සාහය මත ව්‍යාපාරය ආරම්භ කළ යුතු අතර, ආරම්භයේ දී එය පවත්වා ගෙන යාමට අවශ්‍ය මූලික අවශ්‍යතාව යන් මොනවාද යන්නත් සොයා බැලිය යුතුය. එහිදී, ප්‍රාග්ධනය, අමුද්‍රව්‍ය, ගම තුලින් සපයා ගත හැකි අමුද්‍රව්‍යය, පිටින් ලබාගත යුතු දැ අපේක්ෂිත ආදායම සහ වෙළඳ පොල වැනි කරුණු අධ්‍යයනය කර වඩාත් සුදුසු ව්‍යාපාරය කුමක්ද යන්න වටහා ගැනීමත්, තව දුරටත් අවශ්‍ය කරන දේවල් මොනවාද යන්නත් අවධානයට ලක් කිරීම වැදගත් ය. එනම් පුහුණුව, උපදෙස්, රාජ්‍ය ආයතනවල සහාය, ඉඩම්, යන්ත්‍රෝප කරණ ආදිය ලබා ගැනීම සඳහා අදල බලධාරීන් සමග සාකච්ඡා කළ යුතුය. ඒ තුලින් ව්‍යාපාරයේ අනාගත දියුණුව, සලසා ගැනීම පහසුවේ. මෙම අවශ්‍ය තාවන් සියල්ල පිළිබඳව ව්‍යාපාරිකයාට හොඳ අවබෝධයක් තිබේ නම් කිසිදු ගැටළුවකින් තොරව එම ව්‍යාපාරය සාර්ථකව පවත්වා ගෙන යා හැකිය.

එහෙත් ලංකාවේ බොහෝ ප්‍රදේශ වල දැනට ආරම්භ කර ඇති ස්වයං රැකියා ව්‍යාපාර දෙස විමර්ශණාත්මකව බලන විට පෙනී යන්නේ ඉහත සඳහන් කළ කරුණු වල මූලික කරුණු ගැනවත් අවබෝධයකින් යුතුව ආරම්භ කර ඇති කර්මාන්ත ඇත්තේ ඉතාමත් සීමිත සංඛ්‍යාවක් බවයි. දැනට පවත්වා ගෙන යනු ලබන ස්වයං රැකියා බොහොමයක් ආරම්භ වී ඇත්තේ යමෙකුගේ උපදෙස් පරිදි හෝ මූලධනය ඇති නිසා හෝ නැතිනම් තව කෙනෙක් නිරතව ඇති නිසා වේ. මේ නිසාම මෙසේ ආරම්භ කර ඇති ව්‍යාපාර වර්ධනය නොවීම හෝ ඉතාමත් කෙටි කාලයකින් විනාශ වී යාම සිදු විය හැකිය.

**ස්වයං රැකියා වර්ගීකරණය :**

මෑතක සිට ස්වයං රැකියා වලට ප්‍රමුඛස්ථානයක් ලබා දී ඇති ජනසවිය ක්‍රියාකාරී වැඩ සටහන ක්‍රියාත්මක වන දිස්ත්‍රික්ක 13 ක කරණ ලද සමීක්ෂණය



මෝටර් රථ අළුත්වැඩියාව

**ස්වයං රැකියා ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම සඳහා පුහුණුව හා මූල්‍ය පහසුකම් ලබාදීම පමණක් ප්‍රමාණවත් නැත. ඊට අමතරව ඒවා පිළිබඳව සොයාබැලීම අනිවාර්ය වන අතර එම නිෂ්පාදනවලට හොඳ වෙළඳ පොලක් ලබාදීමටද කටයුතු කළ යුතුය. නිෂ්පාදන භාණ්ඩ සඳහා හොඳ වෙළඳ පොලක් තිබීම මගින් එම නිෂ්පාදනයෙන් උපරිම ප්‍රයෝජන අත්කර ගත හැකිය.**

කට අනුව දනට ආරම්භ කර ඇති ස්වයං රැකියා ප්‍රධාන වශයෙන් කොටස් 6 ක් යටතේ වර්ග කර ඇත. එනම් 1. කෘෂිකර්මය හා ඒ ආශ්‍රිත ස්වයං රැකියා 2. සත්ව පාලනය 3. වඩු කර්මාන්තය හා මේසන් වැඩ, 4. රෙදි විවීම සහ ඇඳුම් මැසීම, 5. අත්කම් භාණ්ඩ නිෂ්පාදනය, 6. වෙනත් (වෙළඳාම්, කම්හල් වැඩ, හඳුන්කූරු නිපදවීම, ටින්කරින්,) යනාදි වශයෙනි.

මෙම කර්මාන්ත කොටස් 6 ක් යටතේ වර්ගීකරණය කර ඇතත් එයින් 60% ක්ම කෘෂිකර්මය හා සත්ව පාලනය ආශ්‍රිත ස්වයං රැකියාවන් වේ. වගා ලිං හා වතුර පොම්ප උපයෝගී කරගෙන අරඹා ඇති කෘෂි ව්‍යාපාර මේ අතර ප්‍රමුඛස්ථාන යක් ගනී. මෙම ව්‍යාපාර සඳහා බොහෝ දෙනෙකුට බැංකු ණය සහ රාජ්‍ය ආයතන සහාය නොඅඩුව ලැබී ඇත.

**ස්වයං රැකියා වර්ධනය කෙරෙහි බලපා ඇති බාධාවන් :**

මෙවැනි දෑ කොතෙක් ආරම්භ කර ඇතත් මේවායින් වැඩි කොටසක පැවැත්ම පිළිබඳ ගැටළු පැන නැගී තිබේ. නිෂ්පාදන වලට ස්ථිර වෙළඳ පොලක් නොමැති කම මේ අතර ප්‍රධාන තැනක් ගනී. පුද්ගලයන් ලෙස හෝ කණ්ඩායම් වශයෙන් පළමුවෙන් ආරම්භ කරන ස්වයං රැකියා බොහෝ විට සුළු කර්මාන්ත වන බැවින් ආරම්භයේ දී ඒවායේ නිෂ්පාදනයන්හි තත්ත්වය එතරම්ම සතුටු දායක නොවේ. එනිසා විවෘත වෙළඳ පොලේ භාණ්ඩ සමග තරඟ කිරීමද අපහසුය. ඒ තත්ත්වය මත හඳුන්කූරු, ඉටිපන්දම් විසිතුරු භාණ්ඩ වැනි කර්මාන්ත ඉතා ඉක්මණින් පසුබෑමකට පත්වෙමින් පවතින බව පෙනී යයි. කෘෂිකර්මය ආශ්‍රිත නිෂ් පාදන වලටද ප්‍රමාණවත් මිලක් නො ලැබීම නිසා ඔවුන්ද අධෛර්යට පත් වේ.

**ස්වයං රැකියා ආරම්භ කිරීම සහ පවත්වා ගෙන යාම සඳහා පුහුණුව හා මූල්‍ය පහසුකම් ලබා දීම පමණක් ප්‍රමාණවත් නැත. ඊට අමතරව ඒවා පිළිබඳව සොයා බැලීම අනිවාර්ය වන අතර එම නිෂ්පාදන වලට හොඳ වෙළඳ පොලක් ලබා දීමට ද කටයුතු කළ යුතුය. නිෂ් පාදන භාණ්ඩ සඳහා හොඳ වෙළඳ පොලක් තිබීම මගින් එම නිෂ්පාදන යෙන් උපරිම ප්‍රයෝජන අත්කර ගත හැකිය.**

එහෙත් ශ්‍රී ලංකාවේ ස්වයං රැකියා වන්හි නිෂ්පාදන ක්ෂේත්‍රය දෙස බලන කල පෙනී යන්නේ නිෂ්පාදනයට ප්‍රමුඛ ස්ථානයක් ලබා දුන්නත් අලෙවි කිරීම සඳහා වෙළඳ පොලක් ඇති කිරීමට එවැනි උත්සාහයක් දරා නොමැති බවයි. මේ සඳහා රාජ්‍ය අංශයේ සහාය නො අඩුව ලබා දිය යුතු අතර, ඔවුන්ගේ දේශීය නිෂ්පාදන වලට ප්‍රමුඛස්ථානයක් ලබාදී එවැනි භාණ්ඩ ආනයනය සීමා කිරීම කළ යුතුය. එමෙන්ම මෙම ස්වයං රැකියා වලින් නිපදවන භාණ්ඩ සාධාරණ මිළකට මිළදී ගැනීමේ ක්‍රමයක් සකස් කිරීම අත්‍යවශ්‍යයය. මෙරට ඇති සම්පත් වලින් අපට අවශ්‍ය භාණ්ඩ නිපදවා ගැනීමේ හැකියාව තිබෙන නිසා කල යුත්තේ ඒවා පරිභෝජනය කිරීමට හා මිළදී ගැනීමට ජනතාව පෙළඹවීමයි. මෙමගින් අපේ දේශීය තාක්ෂණයෙන්ද උපරිම ඵල ලබා ගැනීමට හැකිවන අතර මෙම භාණ්ඩ ගෙන්වා ගැනීම සඳහා විදේශ රටවලට ඇදී යන විදේශ විනිමය ප්‍රමාණයද සැලකිය යුතු අන්දමින් අඩුකර ගත හැක.

ස්වයං රැකියා වලට ජනතාව යොමු කිරීමේදී සහ ස්වයං රැකියා ඇති කිරීමේදී ග්‍රාමීය වශයෙන් මෙන්ම ප්‍රාදේශීය වශයෙන්ද ප්‍රතිපත්තියක් ඇතිකළ යුතුය. එනම්, එම ප්‍රදේශයේ අවශ්‍යතාවයන් මත කර්මාන්ත ඇති කිරීමය. උදා – වශයෙන් එක ප්‍රදේශයක ගඩොල් තැනීම සඳහා සුදුසු මැටි ඇත. ඒ සඳහා දක්ෂ ව්‍යාපාරිකයන්ද රාශියක් සිටිය හැක. නමුත් මේ සියළු දෙනාම ගඩොල් නිෂ්පාදන කර්මාන්තයට යොමු වුවහොත් එහිදී ප්‍රශ්ණ රැසක් ඇති විය හැක. එවිට නිෂ්පාදනය ඉහළ ගොස් මිළ පහල බසී. එමෙන්ම නිෂ්පාදන අලෙවි කර ගැනීමේ ප්‍රශ්ණද පැන නැගෙනු ඇත. මේ නිසා අවසානයේදී කර්මාන්ත ය, අඩපන වීමට භාජනය වෙයි.

වෙළඳ පොල ඉලක්ක කර ගත් කර්මාන්ත වලට ප්‍රමුඛස්ථානයක් දිය යුතුය. තවත් ආකාරයකින් කිවහොත් ආරම්භ කරන කර්මාන්තය වෙළඳ පොල මූලික එකක් විය යුතුය. එනම්, වෙළඳ පොලේ අවශ්‍යතාවය, ඉල්ලුම කළ ගණන්, අනිකුත් තරඟකාරී භාණ්ඩවල තත්ත්වය යනාදිය පිළි බඳ විශේෂ අවධානයක් යොමු කර වෙළඳ පොලේ ප්‍රමාණය අනුව නිෂ්පාදන ප්‍රමාණය තීරණය කල යුතුයි. මෙහිදී මූල්‍ය පහසුකම්, උපදේශක සේවා වන්, යනාදිය ලබා දීමේදී වෙළඳ පොලේ හැසිරීම පිළිබඳව අවධානය යොමු කළ යුතු වෙයි. එසේ නොවුනහොත් එම කර්මාන්තයට වෙළඳ පොලේ රැඳී සිටීමට අසීරු විය හැක.

ස්වයං රැකියා ප්‍රදේශයේ ඇති සම්පත් මත පදනම් විය යුතුය. මෙයින් අදහස් කරන්නේ ප්‍රදේශයේ ඇති සම්පත් භාවිතා කරමින් ආරම්භ කළ හැකි කර්මාන්ත වලට මූලික තැනක් ලබාදිය යුතු බවයි. එසේ නොවුවහොත් නිෂ්පාදන මිල ඉහළ යන අතර විවෘත වෙළඳ පොලේදී තරඟකාරී මිල ගණන් වලට අලෙවි කිරීමට නොහැකි වේ.

උචිත තාක්ෂණය භාවිතා කළ යුතුයි. ඒ තුලින් වෙළඳ පොලේ ඇති භාණ්ඩ සමඟ තරඟ කිරීමේ හැකියාවක් ඇති වෙයි.

ස්වයං රැකියාවක් ආරම්භ කිරීම සහ පවත්වා ගෙන යාම පිළිබඳව මනා පුහුණුවක් හා අවබෝධයක් ලැබිය යුතු වෙයි.

මෙම කරුණු පදනම්කරගෙන ස්වයං රැකියා සඳහා ව්‍යාපාරිකයන් යොමු කරවන්නේ නම් එය සාර්ථක උත්සාහ යක් වන අතර ඒ තුලින් ජාතික නිෂ්පාදන යේද වර්ධනයක් ඇති කළහැකි වේ. එමෙන්ම එම ව්‍යාපාරිකයන් ටද ස්ථිර පදනමක් මත තම ව්‍යාපාරය පවත්වා ගන යා හැකිය. එමගින් ව්‍යාපාරිකයා ගේ මූලික අවශ්‍යතාවයක් වන, ආහාර ඇඳුම් පැළඳුම්, ගේදොර, භාණ්ඩ ලබා ගැනීම, දරුවන්ට අධ්‍යාපනය ලබාදීම, යහපත් සෞඛ්‍යය තත්ත්වයක් පවත්වා ගෙන යාම, තමන්ගේම නිවසක ජීවත් වීම, හදිසියකදී අනූනට අත නොපා සිටීමට මුදලක් ඉතිරි කර ගැනීම හා මූලික වශයෙන් ස්ථිර ආදායම් මාර්ගයක් සකස් කර ගැනීම ආදී අපේක්ෂාවන් ඉටු කර ගත හැකිය. නියම ස්වයං රැකියාවක ලක්ෂණ දක්නට ලැබෙන්නේ ඉහතකී සියළු ගුණාංග වලින් යුක්ත ස්වයං රැකියා ව්‍යාපාරයකිනි.